ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

# නාට්‍ය හා රංගකලාව

# ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

## ස්වාධීන නිබන්ධය

විභාග අංකය : MA/DT/0021

ශිෂ්‍යයාගේ නම : සුමින්ද සිරිසේන

ලියාපදිංචි අංකය: GS/HU/1651/2002

# සැලෝමේ

සහ

ඔස්කාර් වයිල්ඩ්ගේ නාට්‍ය පිළිබඳ

විමර්ශනාත්මක විග්‍රහයක්

# ප්‍රස්තාවනාව

## ඔස්කාර් වයිල්ඩ්ගේ නාට්‍ය පිළිබඳ විමර්ශනාත්මක විග්‍රහයක්

'කලාවේදී සත්‍යය යන්න එහි විරුද්ධාර්ථයටද සත්‍යය' යනුවෙන් ඔස්කාර් වයිල්ඩ් කර ඇති ප්‍රකාශය ඔහුගේ දීප්තිමත්වූද, විපත්තිදායකවූද, ජීවන චරිතය උදෙසාද ගැලපෙන බව පෙනී යයි. ඔහු විසින් ලියන ලද දේවල සඳහන් කරුණුවලට බොහෝ සෙයින් සමාන ජීවන රටාවක් ඔහුගේ ජීවිතය තුලද දක්නට ලැබිණි. එක් අතකින් අති විචිත්‍රාකාරයෙන් යුතුව පරිහාණියට යන ජේත්තුකාරයෙකු ලෙස ලන්ඩනයේ විසිතුරු ලොව අත්පත් කරගත් හෙතෙම, රීඩිං ගොවාල්හි නේවාසිකයෙකු ලෙස බංකොලොත් භාවයටද, ගර්හාවටද පාත්‍ර වූ අයෙකි. ඔහු බ්‍රිතාන්‍ය සදාචාර කෛරාටිකත්වයේ ගොදුරු බවට පත් පෙළපතක පුද්ගලයෙකු ලෙසද හැඳින්විය හැකිය. ඩබ්ලිං "Doublin" යනුවෙන් ඔස්කාර් වයිල්ඩ් උපත ලද ඩබ්ලින් නගරය ජේම්ස් ජොයිස් විසින් උච්චාරණය කළ පරිදි ඔහු පිළිබඳ සෑම දෙයක්ම ද්විත්ව ස්වරූපයෙන්ද, සංකර ආකාරයෙන්ද, මිශ්‍ර වූ හැඟීම් වලින්ද යුක්ත විය. ඔහු සමාජවාදියෙක් වූ අතර සමලිංගිකයෙකු ද විය. ඉහළ පාන්තිකයෙකු මෙන්ම, පහළ පාන්තිකයෙකුද විය. කුලියට ගත් පිරිමි ළමයින් සමග සබඳතා පැවැත්වූවෙකු විය. හෙතෙම සමාජවාදියෙකු ලෙස අයිතිවාසිකම් සඳහා සටන් කරන්නෙකු ද විය.

රහසිගත ලෙස සමලිංගික සේවනයේ යෙදෙමින් කීර්තිමත් පුද්ගලයෙකු සේ ජීවත් වීම හේතුකොටගෙන ප්‍රසිද්ධ පුද්ගලයෙකු ලෙස ඔහුගේ අනන්‍යතාව හා පුද්ගලික ජීවිතය අතර ගැටුමක් දක්නට ලැබීම ඔහුගේ වයසේදී දක්නට ලැබුණු ආවේනිකත්වයකි.

19 වන සියවසේ අගභාගයේදී මිනිස් චරිත වටා හොල්මන් කරන්නට වූ සාපරාධී, අරාජික බලවේග සන්සුන් වැදගත් සමාජයන්හි මතුපිටට යටින් ක්‍රියාත්මක වෙමින් තිබුනි. එය කලාව කලාව සඳහා වූ යුගයක් නම්, එයම කලාකරුවන් මුඩුක්කුවල ජීවත් වන්නවුන්ට උපකාර කරමින්ද, ණයගැති වෙමින්ද ගතකළ කාල පරිච්ජේදයකි. මෙයම ආචාර සම්පන්න සමාජය විසින් දිළිඳුභාවයද, සංවේදීභාවයද යටපත් කළ යුගයක් ද විය.

මෙසමයෙහි සිග්මන් ප්‍රොයිඩ් අපරාධයන්හි ආවරණ පෙදෙසද, අපරාධ හා කල්පිතයද පිළිබඳ අනාවරණය කිරීම අරඹා තිබුණි. මෙම සංසිද්ධීන්ට ඔහු දී තිබූ නාමය "අවිඥානකත්වය" (Unconsiciousness) යන්නය.

1880-90 දශකයන් වනාහි උප සංස්කෘතීන් හා පාතාල ලෝකයද, සමාජ පර්යේෂණ සහ විචිත්‍ර සංවේදනාවන්ද, අභූතරූපී ඇදහීම්ද කළඑලි බැසි යුගයකි. තවද, ලිංගික නිදහස පිළිබඳ නව සිතුවිලි ධාරාවන්ද, ආගමික ගූඪත්වයද, දේශපාලන විප්ලවද කැළතෙන්නට වූ යුගයකි.

මේ අයුරින් 19 වන සියවසේ අගභාගයේදී දක්නා ලද යටකි ගුණාංග 1960 ගණන් පිළිබඳ එනම් සුඛ විහරණය පරමාර්ථ කොට ගැනීම හා කාල්පනික සමෘද්ධිමත් ලෝකයක් පිළිබඳ චින්තාවන් බිහිවන යුගයක් බවට පුදුම සහගත ලෙස අනාවැකි පළ කිරීමක් විය. වෝල්ටර් පීටර් සහ හෙන්රි ජේම්ස්ට අනුව වත්මන් මිනිස් අත්දැකීම් ඉතා පැටලිලි සහිත සහ බහුලද වන අතර ඒවා සමාජයේ ආගමික පද්ධතීන්ට ලෙහෙසියෙන් ගැලපීම දුෂ්කරය. පොදු බව සහ පෞද්ගලිකත්වය අතරද, සම්ප්‍රදාය හා පලපුරුද්දද අතර පවත්නා බිඳීම කලාකරුවාට එක්වූ කල හේ එක් මට්ටමකදී පොදු ලෝකයට අයත්වන අතර, ඔහුම කැරළිකරුවෙකු, අපරාධකරුවෙකු හා අරාජිකයෙකු ලෙස දිස්වෙයි. ඔස්කාර් වයිල්ඩ් තමා තුළ පවත්නා බාහිර හා අභ්‍යන්තර වෙනස්කම නම් වූ අගාධය අසල රැඳී සිට අවසානයේ එතුළම අතුරුදහන් වූ බව පෙනේ.

වයිල්ඩ්ගේ මෙම අර්බුදකාරී ද්විත්ව ස්වරූපයට හේතුවූ කරුණු ඔහුගේ නිවසට සම්බන්ධය. ඔහු ලිංගික වශයෙන් සමලිංගිකයෙකු මෙන්ම සැමියෙකුද ලෙස ද්විත්ව ස්වරූපයක් ගත්තා සේම ඔහුගේ ජාතිය පිළිබඳවද එවැනිම ද්විත්ව ස්වරූපයක් දිස්විය. ඔහු මධ්‍යම වික්ටෝරියානු ඩබ්ලිනයේ ඇන්ග්ලෝ-අයිරිෂ් පවුලක උපත ලද අතර එංගලන්තය හා අයර්ලන්තය අතර අර්බුදය ඔහුගේ නම තුළම දිස්විය. පුරාවෘත්තවල සඳහන් අයිරිෂ් ජාතික වීරයෙකුගේ නම වන "ඔස්කාර්" නමින් හේ බෞතිස්ම කරන ලද අතර "වයිල්ඩ්" යන්න ඉංග්‍රීසි නමක් විය. ඔහු අයත්වූ ඇන්ග්ලෝ-අයිරිෂ් ජන වර්ගය 17 වන සියවසේ අයර්ලන්තයේ ජනපද පිහිටුවා පදිංචි වූ ඉංග්‍රීසි ජාතික ජනපදිකයන් වන අතර, අයිරිෂ් ජාතිකයින් ඔවුන් සැළකුවේ පිටරැටියන් නැතහොත් ආක්‍රමණිකයින් ලෙසය. එලෙසම සිය මව්බිම වන එංගලන්තයේදී ද ඔවුන්ට දැනුනේ තමන් කොන්වූ පිරිසක්

ලෙසය. මෙලෙස තමාගේ රට තුළම විදේශිකයෙකු බවට පත්වූ ඔහුට තමා අයර්ලන්තය තුළදී ඉංග්‍රිසි ජාතිකයෙකු ලෙසත්, එංගලන්තයේදී අයිරිෂ් ජාතිකයෙකු ලෙසත් දැනෙන්නට විය. සත්‍ය වශයෙන්ම වයිල්ඩ්ගේ ජිවන ගමන මෙම අසිරු ලෙස ප්‍රතිෂ්ඨාපනය කෙරුණු ජන කොට්ඨාශයේ පිරිහිම හා බොහෝ සේ සම්පාත වෙයි. ඔහුගේ තරුණ සමයේදී තමා පක්ෂපාතිත්වය දැරූ අයර්ලන්ත පල්ලිය (Church of Ireland) බිඳ වැටුණි. 1900 වසරේදී ඔහු මියයන විට ඇන්ග්ලෝ-අයිරිෂ් ජන කොට්ඨාශයට තම ඉඩකඩම් අහිමිකරවන ඉඩම් පනත ක්‍රියාත්මක වෙමින් පැවතුනි. The Important of Being Earnest හි ජැක් වර්දින් පිළිබඳව බ්‍රැක්නෙල් මහත්මිය කරනු ලබන හැඳින්වීමේදී මෙන් වයිල්ඩ්ගේ මුල් ජන්මයද ක්‍රමෙන් පරිහානියට යන්නකි. ඔහු උපත ලද්දේ වඳවී යන ජාතියකට අයත්වය. ඔහුගේ අර්බුදකාරී අනන්‍යතාව පුළුල් අනාරක්ෂිත ජනතාවකගේ පොදු උරුමයක් වූ අතර, Earnest හි තමා කාගේ කවුදැයි කිමට නොදන්නා චරිත මෙන් විය.

ඔස්කාර් ෆින්ගල් ඕ'ෆ්ලාහර්ති විල්ස් වයිල්ඩ් නම්වූ කුඩා දරුවෙකු ලෙස ඔහුට ඇන්ග්ලිකන් පොදු පාසලෙන්ද, ඩබ්ලින්හි ත්‍රිත්ව විද්‍යාලයෙන්ද වියදම් අධික අධ්‍යාපනයක් ලබාදෙන ලදී. ත්‍රිත්ව විද්‍යාලයේදී ලද ශිෂ්‍යත්වයකින් ඔහු ඔක්ස්ෆර්ඩ් වලට තේරුණි. මෙය වනාහි අයිරිෂ් ජාතික ප්‍රභූන්ගේ පුතුනට ලැබෙන ඉතා හොඳ අවස්ථාවක් වුවද, නොවැලැක්විය හැකි ලෙස එය රටින් නෙරපා හැරීමක්ද විය. 1840 ගණන්වල අගභාගයේදී ඇතිවූ අයර්ලන්ත දුර්භික්ෂ සමයේද, ඉන් ටික කලකට ඉහත සිටද දුගීභාවය හා ආහාර හිඟකම නිසා අයිරිෂ් වැසියන් බොහෝ දෙනෙක් බෝට්ටු මගින් බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව හා ඔස්ට්‍රේලියාවට පලාගොස් සිටියහ. සැබවින්ම වයිල්ඩ් ඒ ගණයට අයත් වුවකු නොවුවද, ඔහුගේ ආගමනයද 19 වෙනි සියවසේ දුර්භික්ෂය නිසා පැන ආවුන්ගේ ගණයෙහි ලා සැළකීමට තරමක ඉහළ සමාජය පෙළඹිය හැකි බැවින් ඔක්ස්ෆර්ඩ්හි මැග්ඩලේන් විද්‍යාලයේදී හේ හැකි ඉක්මනින් සිය ඩබ්ලින් උච්චාරණ විධිය වෙනස්කර ගැනීමට උත්සුක විය.

ගොවියන්ට හා ඉඩම් නැති කම්කරුවන්ට සිය රට හැර යාමට සිදුවුවා සේම, ජොනතන් ස්ජ්ෆ්ට්, සැමුවෙල් බෙකට් වැනියවුන්ගෙන් සැදි කලාකරු හා උගත් පරපුරකටද සිය කාර්ය සාධනයට උචිත උත්තේජනයක් ලද නොහැකි, දියුණු නොවන, පූජකයින් විසින් හසුරුවන, දුගීභාවයට නතුවූ ජනපදයක් බවට අයර්ලන්තය පහත වැටුනි.

ඇන්ග්ලෝ-අයිරිෂ්වරුන් සිය රට තුළම පිටස්තරයින් වුවද, ඔවුන්ට කීර්තිමත් දේශපාලනඥයින් හා සංස්කෘතික ක්ෂේත්‍රයේ කීර්තිධරයින් රැසක් බිහිකර ගැනීමේ හැකියාව තිබුණි. තියබෝල්ඩ් වුල්ෆ්ටෝන්, චාල්ස් ස්ටුවට් පානෙල්, විලියම් බට්ලර්, යේට්ස් මෙවැනි උගතුන් කිපදෙනෙකි. වයිල්ඩ්ගේ දෙමාපියන් එක්තරා ප්‍රමාණයකට මෙම උසස් සමාජ සංවිධානයට අයත්වූහ. වයිල්ඩ්ගේ පියා වන සර් විලියම් වයිල්ඩ් ඉහළ සමාජයේ විශිෂ්ට ප්‍රභුවරයෙක් වූ අතර, අයර්ලන්ත රැජිණගේ අක්ෂි වෛද්‍යවරයා ලෙස පත්කර තිබුනි. එපමණක් නොව හේ අයිරිෂ් ඉතිහාසය හා සංස්කෘතිය පිළිබඳවද, පුරාවිද්‍යා ගවේෂකයෙකු හා ජනවහර පිළිබඳවද ගෞරවනීය උගතෙකුද විය. ඔහුගේ බිරිඳවන ජේන් වයිල්ඩ් ජාතිකත්ව කිවිඳියකද, කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කරන්නියකද, “ස්පෙරන්සා” යන නමින් යුතුව 1840 ගණන්වලදී ජනරජයේ තරුණ අයර්ලන්ත ව්‍යාපාරයටද සම්බන්ධ වී සිටියාය. ඔස්කාර් වයිල්ඩ් මෙන්ම ඇයද, තේජස්වී, අලංකාරයට ප්‍රිය, සම්මතවාදී නොවන කාන්තාවක වුවාය. නිසැකවම සිය සීමාන්තික ගති ස්වභාවයන්ද, නාට්‍යමය ඉරියව්ද වයිල්ඩ් හට උරුම වූයේ ඇයගෙන් බවට සැක නැත. ඔහුගේ පුද්ගලභාවයේ අයිරිෂ් හා ඉංග්‍රීසි යන බෙදීමේ මුල් අවස්ථාව සිය ගෘහ ජීවිතයේ පසුබිම දක්වා දිවයයි.

වයිල්ඩ් දෙමව්පියෝ එක්වරම විලාසිතා බහුල ඉහළ පන්තියේ සාමාජිකයින් වන අතර, සාමාන්‍ය අයිරිෂ් ජාතිකයින් බවටද පත්වෙති. එසේම වයිල්ඩ්ගේ ප්‍රහසන නාට්‍ය එක්වරම නිර්දෝෂී සම්මතවාදී ස්වරූපයක් ගන්නා අතර රහසිගතව හිංසාකාරීද වෙයි. ඔහු ඉංග්‍රීසිකාරයෙකුට වඩා හොඳින් ඉංග්‍රීසි කාරයෙකු වීමට යත්න දරණ අවස්ථාවන් උදාකර ගන්නා අතර ඔවුන්ගේ සංකේත, ශෛලීන් හා සාහිත්‍යාත්මක යෙදුම් ස්වදේශිකයෙකුට වඩා හොඳින් හැසිරවීමට හැකිබව ප්‍රදර්ශනය කරවයි. එහෙත් මෙය නැති ගුණ වැනීමේ අනුකරණයක්ද, නැතහොත් උපහාසාත්මක රචනාවක්ද, එසේත් නැත්නම් බොරු වර්ණනාවේ අහිංසක ස්වරූපය ගන්නා උපහාසාත්මක රචනාවක්ද යන්න පැහැදිලි නොවේ. මෙම ක්‍රියාවේදී කෙතරම් ලෙහෙසියෙන් ස්වදේශිකයා පහත හෙළීමට ආගමනිකයා සමත් වුවද යම් අනාරක්ෂිතභාවයක්ද, තැවුල් සහගත ස්වභාවයක්ද හැම විටම දිස්වේ. The Picture of Dorian Gray හි දෙබස් ඛණ්ඩ තුළින් මෙම වරදකාරී හැඟීම, තමාම පාවාදීම සහ වංචාකාරී ස්වභාවය සොයා ගැනීම අසීරු නොවේ. වයිල්ඩ් තමා ව්‍යාජ

පුද්ගලයෙකු බවත්, සමාජ පරපෝෂිතයෙකු බවත්, වෙස් මුහුණක් පැළඳගත් පුද්ගලයෙකු ලෙසත් දැන සිටියේය. මේ නිසා හේ ජීවිතය හා කලාව යනු උපහාසාත්මක ප්‍රබන්ධයක් ලෙසත්, අනුන්ගේ ඉරියව් පැමක් ලෙසත් හුවා දැක්වීමට උත්සාහ කළ අතර, "සත්‍ය" පුද්ගලභාවයක් නොමැති බවත් සියළු අනන්‍යතාවන් අස්ථිර හා තාවකාලික බවත් පළ කළේය. මෙමගින් ඔහු සිය ලිංගිකත්වය හා ජාතිකත්වය පිළිබඳ සැකමුසු බව කලාත්මක කටයුතු සඳහා උපයෝගි කර ගත්තේය. වයිල්ඩ් හට යථාර්ථවාදය යනු වෙස් මුහුණ මත වෙස් මුහුණ, කැඩපත මත කැඩපත, වචනය මත වචනය තබා කරන ක්‍රීඩාවකි. මෙම ප්‍රතිරූප බිඳ දැමීමේ හාස්‍යජනක ක්‍රියාවන්ගෙන් ලන්ඩනයේ ප්‍රේක්ෂකයින් අමන්දානන්දයට පත්වූ නමුදු ඉන් එංගලන්ත සභාව දෙදරුම් කෑමේ ප්‍රතිඵලයක් ලෙස ඔහු ඉවත්කර දැමිණ.

ඔස්කාර් වයිල්ඩ්ගේ මෙන්ම ලිංගික අපචාර මත අපකීර්තියට පත් අයිරිෂ් පාර්ලිමේන්තු පක්ෂයේ නායක චාල්ස් ස්ටුවට් පානෙල්ගේද චරිතවලින් සංකේතවත් වනුයේ ඇන්ග්ලෝ-අයිරිෂ්වරුන්ගේ අභ්‍යන්තර/පිටස්තර උභතෝකෝටික ප්‍රශ්ණයයි. මොවුහු මුලදී ප්‍රශංසාවටද, සම්මානයටද, පාත්‍ර කළ අතර, පසුව නීති කඩන්නන් ලෙස හා සදාචාර විරෝධීන් ලෙසට පීඩනයට පත් කරන ලදහ. ඉංග්‍රීසි සමාජය තුළ ඔස්කාර් වයිල්ඩ්ගේ සීඝ්‍ර දියුණුව පිළිබඳව සළකන කල ඔහු විසින් අසීමිත ලෙස අස්ථිරභාවය පිළිබඳව පළකල හැකිමද, ඔහු තුළ පැවති ගරු සරු රහිත අහංකාරභාවයද සිතාමතාම විපත් කැඳවා ගැනීමට හේතු පාදක වූ බව පෙනී යයි. වයිල්ඩ්ගේ නාස්තිකාර ජීවන රටාවද සම්මත ආචාර ධර්මවලට දරුණු ලෙස ගර්හා කිරීමද නිසා සිය විනාශය වෙතට ඔහු වහ වහා ළංවූ බව පෙණින. මෙය වනාහි ඉංග්‍රීසි සමාජයට සිය අභිමතයක් කරනු පිණිස සරදම් කිරීමක් වැනි විය. වයිල්ඩ්ගේ අනාගත විනාශය පිළිබඳ දිවැස් කීමක් වැනි සෙවනැල්ලක් The Picture of Dorian Gray හි වැටී ඇති අතර කෙනෙකුගේ අස්වාභාවික ලෙස මෘදු වූ ලක්ෂණ පිටුපස මාරාන්තික රහසක් පැසවමින් පවතින බව දක්වයි. වයිල්ඩ් සිය අශෝභන, කුලීකාරයෙකුගේ වැනි සිරුර විදේශීය ඇඳුමකින් සරසා සිටියද, මෙම සිත් ඇදගන්නා පෙනුමට යටින් ඩෝරියන්ගේ රූපය වැනි ඔහුගේ ආත්මය තුළ ලෝක සම්මත ආචාර ධර්මවලට පිටුපෑමේ ලක්ෂණ ස්ථිරසාර ලෙස වැඩෙමින් පැවතිනි, මෙය පුදුමයක් නොවන්නේ සත්‍යතාව යනු ශෛලිය සහ ඉරියව් පිළිබඳ ප්‍රශ්ණයක් පමණක් බව ඔහු

විශ්වාස කළ බැවිනි. එක් වෙස් මුහුණක් ඉවත් කළ විට වෙනත් වෙස් මුහුණක් හමුවේය යන්න ඔහු ඇදහුවකි.

ඇන්ග්ලෝ-අයිරිෂ් සම්ප්‍රදාය විශිෂ්ට දේශපාලකයින් බිහි කළා සේම එය ඉංග්‍රීසි සාහිත්‍යයට ප්‍රමුඛ සහ නොනැසෙන නම් රැසක් දායාද කර ඇත. ස්විෆ්ට්, ස්ටර්න්, බර්ක්, යේට්ස්, ජොයිස් යන නම් මෙසේ අමරණීයව පවතී. ඇන්ග්ලෝ - අයිරිෂ් ආධිපතිත්වය දුට හැකි ප්‍රධාන නාට්‍ය වර්ගයක් නම් Dramatic Comedy නොහොත් නාට්‍යමය ප්‍රහසනයයි. ෂෙරිඩන්, ගෝල්ඩ්ස්මිත්, ෂෝ, වයිල්ඩ්, සිංගේ සහ බෙකට් නොමැති ඉංග්‍රීසි වේදිකාවක් පිළිබඳව සිතිය නොහැකි තරමිය. අයර්ලන්ත නාට්‍යකරුවන් ඉංග්‍රීසි සමාජ ජීවිතයේ අභ්‍යන්තරයට එබී බලා එහි පවත්නා ස්වභාවයන් වටහා ගැනීමට කොතෙක් උත්සුක වුවද ඔවුන්ගේ කාර්ය සාධනය පිළිබඳව දෑනුදු බලනුයේ වපරැසිනි. වයිල්ඩ් ඔහුගේ කලාව සඳහා ඉහළ සමාජය දෙසට නැඹුරු විනම් එයට එක් හේතුවක් වූයේ සමාජ විධීන් හා සම්මතයන් එම සමාජය තුළ අස්වාභාවික ලෙසත්, ප්‍රදර්ශනාත්මක ලෙසත් පැවතීමය. එතුළ පවත්නා අතිශයින් නිවැරදිවූ, ආචාර ලීලාවන් හේතුකොටගෙන එම සමාජයම කලා කෘතියක් ලෙස ඔහුට පෙණින. ප්‍රහසනය, ස්වාභාවිකත්වය හා කෘත්‍රිමභාවය අතර ගැටුමද, පුද්ගලයා හා සමාජය අතර ඇතිවන වැරදී හැඩගැසීමද උපයෝගී කර ගනියි. මෙම කරුණු සමාජයෙන් පිටස්තරයෙකුට පෙනෙනුයේ ඉතා හොඳ අමුද්‍රව්‍ය වශයෙනි. එක් පිළිගත් සත්‍යයක් නම් වත්මන් ඉංග්‍රීසි සාහිත්‍යය පෝෂණය වී ඇත්තේ පිටරැටියන්ගෙන් හෝ රට හැරගිය අයගෙන් බවය. මෙම රචකයින් බොහෝ දෙනෙකුට සිය කෘති සඳහා අමුද්‍රව්‍ය ලැබී ඇත්තේ වෙනස් සංස්කෘතින් තුළ ඇතිවන ගැටුම් තුළිනි. වයිල්ඩ් ලියා ඇත්තේ “මධ්‍යස්ථභාවය” හා “කොන් කිරීම” අතර ඇතිවන ආතතියෙන් උද්ගතවන කරුණු වටාය. ජේම්ස්, කොන්රැඩ්, යේට්ස්, එලියට්, පවුන්ඩ් සහ ජොයිස්ගේ කෘතිවලද මෙම ලක්ෂණ විද්‍යාමාන වෙයි.

ඔහුගේ The Critic As Artist නම් කෘතිය විචාරය පිළිබඳව ඔහු විසින් දක්වන ලද අදහස් හෙලිදරව්කරන්නකි. මෙම ග්‍රන්ථය වනාහි නිර්දය ලෙස කලාව හා ජීවිතය පිළිබඳව පවත්නා වික්ටෝරියානු මිත්‍යාමත හා විශ්වාස එකින් එක ඉතා සූක්ෂම ලෙස පුපුරුවා හරින්නකි. එම ග්‍රන්ථය ගිල්බට් හා අර්නස්ට් නම් චරිතද්වය අතර ඇතිවන සංවාද ස්වරූපයෙන් ලියා ඇත.

සමාජවාදියෙකු වශයෙන් වයිල්ඩ් බලාපොරොත්තු වූයේ සමාජයේ සෑම මිනිසෙකුටම, තමා "කලාත්මකව" ප්‍රකාශනයට පත්කිරීමේ හැකියාව පැවතිය යුතු බවයි. එහෙත් ඔවුන් දීන ලෙස වැඩෙහි යොදවා ඇති බැවින් මෙය අපහසු බව ඔහුට වැටහින. මෙම තේමාව The Soul of Man Under Socialism හි සාකච්ඡා කෙරේ. ශ්‍රමය යාන්ත්‍රිකරණය වී, මිනිසාට නිදහස උදාවී, සිය පෞරුෂය වර්ධනය කරගත හැකි වටපිටාවක් උදා කිරීම පිළිබඳ ඔහුගේ අදහස් එහි ප්‍රකාශයට පත්කර ඇත. මෙම කෘතිය අද පවා, විප්ලවවාදී අදහස් ප්‍රකාශ කෙරෙන විශිෂ්ට සමාජවාදී කෘතියක් ලෙස පවතී.

සිරගෙයින් නිදහස් වූ පසු ඔහු ලියූ The Ballad of Reading Goal කෘතිය අයර්ලන්ත සාහිත්‍යයේ වැදගත් කාව්‍ය කුලයකට අයත් වෙයි. දේශපාලන සිරකරුවන් ලියූ කෘති සඳහා ගරුකිරීම අයර්ලන්තය තුළ ඇත. කෙසේ වෙතත් වයිල්ඩ් සිරගත වූයේ දේශපාලන හේතු මත නොවේ. මෙම කෘතියේදී දැඩි පුද්ගලවාදියෙකු වූ වයිල්ඩ් "මම" යන්න අමතක කොට "අපි" යන්න යොදා ගනිමින් සමාජ සාමූහිකත්වයට පිවිසෙයි. මෙය ඔහුගේ වෙනත් කෘතිවල දක්නට නොලැබෙන්නකි. වයිල්ඩ් මෙහිදී කාව්‍යයේ එල්ලය යොදා ගන්නේ  තමා වෙතට නොව මුළු මහත් සිරකරුවන් සමූහයම වෙතටය.

"මම කවිය හා ගීත රචනය මෙන් මගේ අදහස් ප්‍රකාශනය සඳහා කලාවේ ඉතා සක්‍රිය අංගය වන නාට්‍යය තෝරා ගනිමි". De Profundis හි දැක්වෙන මෙම වචන මාලාව හුදු මුඛරී ආත්මාර්ථකාමියෙකුගේ භාෂණයක් නොව සිරභාරයට පත්වීම දක්වා ඇද වැටුනු මිනිසෙකුගේ ප්‍රකාශයකි. වයිල්ඩ්ගේ නාට්‍ය කලාව පිළිබඳ කරුණු සටහන් කිරීමේදී, ඔහුගේ මුල්ම නාටකය පැරිසියේදී රචිත The Duchess of Padua බව පෙනී යයි. මෙම නාටකය ඇමෙරිකානු නිළියක වූ මේරි ඇන්ඩර්සන් විසින් සිය පරීක්ෂාවේදී ප්‍රතික්ෂේප කරනු ලැබීම නිසා නාට්‍ය කලාවෙන් ඔහු මද කලකට ඈත්ව සිටියේය. ඔහු 1883 දී කොන්ස්ටන්ස්මේරි ලොයිඩ් සමග විවාහයෙන් අනතුරුව දරුවන් දෙදෙනෙකු ලද්දේය. මෙයින් පසු හේ විචාර ග්‍රන්ථ, කාව්‍ය, නවකතා, කෙටිකතා රචනා සහ නාට්‍ය රැසක් බිහි කළේය.

මේවා අතර රචනාවක් වන The Cantervill, සුරංගනා කතා වන Happy Prince and Other Tales සහ සංවේදී නවකතාවක් වන The Picture of Dorian Gray ද විය.

1892 දී විශිෂ්ට නාට්‍යයක් වූ Lady Windermere's Fan වේදිකාගත කෙරිණි. මෙය විශිෂ්ට ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් ලද නමුත් විචාරක අවධානය යොමුවූයේ මඳ වශයෙනි. සැලෝමේ නාටකය අනතුරුව නිෂ්පාදනය වූ නමුදු චැම්බර්ලේන් සාමිවරයා එහි නිෂ්පාදනය අවලංගු කළේ වයිල්ඩ්ගේ ඉංග්‍රීසි පුරවැසිභාවය අවලංගු කරන බවට තරවටු කරමිනි. A Woman of No Importance, 1893 දී සාර්ථක ලෙස නිෂ්පාදනය වූ අතර, අනතුරුව An Ideal Husband සහ The Importance of Being Earnest යන නාට්‍ය නිෂ්පාදනය විය. ඒ 1895 වර්ෂයේදීය. මෙම වසරේදී වයිල්ඩ් ඔහුගේ ජීවිතයේ ඉහළම තලයට නැග සිටියේය.

8 වෙනි කින්ස්බරියේ මාකස්, වයිල්ඩ්, සිය පුත්‍රයා වන ඇල්ෆ්‍රඩ් ඩග්ලස් සාමිවරයා සමග සමීප ඇසුරක් පවත්වන බැවින් ඔහු සමලිංගිකයෙකු බවට චෝදනා කළේය. වයිල්ඩ් මෙයට විරුද්ධව අපහාස නඩුවක් පැවරූ නමුදු චෝදනාව සත්‍ය බව ඔප්පුවී තිබුණි. අනතුරුව විභාග කළ නඩු තුනකින් පසු ඔහු දෙවසරකට සිරගෙට යැවිනි. රීඩිං බන්ධනාගාරයේදී හේ අනුකම්පාව ජනනය කරන De Profoundis නම් වූ, ග්‍රන්ථයක් තරම් විශාල ලිපිය ඩග්ලස් වෙත ලිවිය.

අයහපත් සෞඛ්‍ය තත්ත්වය හා පිරිහුණු ආත්ම ශක්තිය ඇති වයිල්ඩ් 1892 දී නිදහස් වූ අතර ඔහු කතෝලික ආගම වැළඳ ගත්තේය. ඉන්පසු පැරීසියට ගිය හෙතෙම ප්‍රංශය, ඉතාලිය හා ස්විට්සර්ලන්තය වැනි රටවල සංචාරය කළේ තනිව හා දුක්ඛිතවය. 1900 නොවැම්බර් මස 3 වෙනි දින ඔස්කාර් වයිල්ඩ් මිය ගියේය. ඔහුගේ සිරුර ප්‍රංශයේ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

වයිල්ඩ්ගේ නාට්‍ය කෘතීන් අතර කාව්‍යමය නාට්‍ය රැසක් වෙයි. The Nihilists (1883), The Duchess of Padua (1883), A Florentine Tragedy (1894) හා Salome (1896) ඒ අතර වෙයි.

සුළු වැරදි සොයමින් දොස් පවරන විචාරකයින් හට බර්නාඩ් ෂෝ ප්‍රකාශ කර සිටි දෙයක් නම් හැම නාට්‍ය රචකයාටම "ඔස්කාර් වයිල්ඩ් නාටකයක්" ලිය නොහැකි බවයි. ඔහු මේ බව ප්‍රකාශ කළේ වයිල්ඩ්ගේ විශිෂ්ට කෘතීන් ලෙස සැළකෙන Lady

Windermere's Fan, A Woman of No Importance, An Ideal Husband, The Important of Being Earnest යන නාට්‍ය පිළිබඳව අවධානය යොමු කරමිනි.

මෙම නාට්‍ය ප්‍රතිසංස්කරණ හා 18 වෙනි සියවසේ සදාචාර ප්‍රහසන (Comedy of Manners) නාට්‍ය ගණයට ඇතුළත් කෙරේ. මෙම නාට්‍යවල ලෝකය සීමාවී තිබුනේ ධනවත්, රස්තියාදුකාර, නිසරු, නොවැදගත් පිරිස් හා ඔවුන්ගේ කෙළවරක් නොමැති ප්‍රියසම්භාෂණ, තේ සාද, විවාහ යෝජනා, දික්කසාද හා අනුන්ගේ දොස් සෙවීමේ කටයුතු වලටය. කතා වස්තුව ගෙතීමට උපයෝගීවන උපක්‍රම කෘත්‍රිම ඒවා විය. නැතිවූ ලිපියක්, හමුවුනු සාරි කටුවක්, නැතිවූ අවානක්, පියා හඳුනා ගැනීමට නොහැකි හදාගත් දරුවෙක් යනාදිය එවැනි උපක්‍රම වේ. මෙම නාට්‍ය වඩා ගැඹුරු (Serious) වූ විට භාවාතිශය (Melo Dramatic) ස්වරූපයක් ගනු ලැබුවද, උසස් ප්‍රහසන ස්වරූපය ගත්විට ඉංග්‍රීසි වේදිකාවේ ප්‍රශස්ත ස්වරූපයක් ගනී.

මෙම නාට්‍ය සම්ප්‍රදායික විසිත්ත කාමර නාටක වුවද, වයිල්ඩ් එම නාට්‍ය මගින් නිරූපිත සමාජය හාරා අවුස්සා හාස්‍යය උපදවන බව පැහැදිලි විය. සමහරවිට සංවේදී සහ දුක් සහිත අවස්ථා උපයෝගී කර ගනිමින් වික්ටෝරියානු සම්ප්‍රදායට අයත් ආප්තෝපදේශ හා විකට කියුම් චරිත ලවා කියැවීමෙන් තමන් ජීවත්වන සමාජයම සමච්චලයට බඳුන් කිරීම වයිල්ඩ්ගේ අභිප්‍රාය විය.

මෙම නාට්‍යවල බොහෝ විකට කියුම්, ආප්තෝපදේශ හා උපහාස වාක්‍යාදිය ගැබ්වුවද, සමහර දර්ශනවල දීර්ඝභාවය නිසා නාට්‍යයේ ක්‍රියාව ඇන හිටින බවට චෝදනා නැගිනි. එහෙත් එම දර්ශනවල අති විශිෂ්ට දෙබස් ඇතුළත් විය. කෙසේ වුවද, වයිල්ඩ්ගේ ද පුදුමයට මෙන් මෙම නාට්‍ය හතර ඔහු අති ජනප්‍රිය නාට්‍ය කරුවෙකු බවට පත් කළේය.

ඔහුගේ නාට්‍ය කෘතීන් අතර විශිෂ්ට කෘතියක් සේ සැළකෙන්නකි. The Important of Being Earnest එය මනාලෙස පාලනය කරන ලද හාස්‍යජනක සිදුවීම් මගින් මන්මත් කරන හාස්‍යයක් ජනිත කරන්නකි. එහි වේගයෙන් ධාවනය වන හාස්‍යෝත්පාදක කතා වස්තුව නාට්‍යමය කාර්යය අධි තාත්වික තලයකට ඔසවා තබන අතර නාට්‍යයේ පැවැත්ම රඳන්නේ ඒ තුළ පවන්නා ප්‍රමෝදය ඇති කිරීමේ ජවය මතය.

මෙම නාට්‍යය මායාවක් පසුපස මායාවක් බැගින් එක් කරයි. ඒ අතරම ඉහළ සමාජයේ අස්වාභාවිකත්වය විදහාලයි. සත්‍ය තොරතුරු හා කල්පිතය අතර ඇති වෙනස බිඳ හෙලයි.ඒ අතරම එහි අඳුරු යටිපෙළ නිරන්තරව අපට පෙන්වාලයි. නාට්‍යය කරකැවෙන්නේ වරදකාරී රහස්, බිඳුනු අනන්‍යතා, අවමානයට ලක්කල උත්පත්තීන් යන, කතුවරයාට ප්‍රශ්න ඇති කිරීමට තරම් වැදගත් කරුණු වටාය. අතිශය බරපතල කරුණු අවිඥානකව සංසිඳවීමේ ගුණයක්ද, එම කරුණු හිංසාරහිත කල්පිතයන් බවට හැරවීමේ හැකියාවක්ද, එකී කරුණුවලට තෘප්තිමත් කරවන ආකාරයේ විජ්ජාමය විසඳුම් ලබාදීමේ හැකියාවද මෙම නාට්‍ය තුළ විද්‍යාමාන වෙයි. ජැක් වර්දින්ගේ රහසිගත අනන්‍යතාව යහපත බවට හැරවීමද, ඉහළ සමාජයෙන් ඔහු නෙරපනු වෙනුවට එතුළට අන්තර්ග්‍රහණය වීමට ඉඩ සැළසීමද එවැන්නකි. සැබවින්ම වයිල්ඩ්ගේ නාට්‍ය සියල්ලේම පාහේ මෙම සමනය කිරීමේ ගුණය පවතින බව කිව යුතුය. මෙම කෘතින් මගින් ඉහළ සමාජ තලයේ හාස්‍යජනක ස්වභාවය හාරා අවුස්සන්නේ නම් එසේ කරනු ලබන්නේ එම සමාජයේම පවත්නා සම්මතයන් හා හැඩතලයන් තුළ සිටගෙනමය. විනීත සමාජය අස්වාභාවිකයයි ප්‍රකාශ කෙරෙන අතරම, එය වැදගත් නොවන බවටද ඉඟි කරනු ලබයි. මෙම නාට්‍යයන් හි පවත්නා හාස්‍යමය ගුණයෙන් ඉංග්‍රීසි වංශවත් පරපුර අමනයින් හා පරපෝෂිතයින් සේ දක්වයි. එහෙත් එය සමාජයේ සිටින්නන් විසින්ම විවේචනයට භාජනය කරනුද දැකිය හැක. වයිල්ඩ් සමච්චලයට ලක් කරන නමුදු ඔහු එසේ කරනු ලබන්නේ යම් කාරුණික බැඳීමකින්ද යුක්තවය. බලයලත් විකටයෙකු විනා ක්‍රෝධයෙන් පහර දෙන්නෙකු ලෙස ඔහු ක්‍රියා නොකරයි. මෙම බලයලත් විකටයාගේ භූමිකාව එංගලන්තයේ වසන අයර්ලන්ත වාසීන්ට හුරු පුරුදු දෙයකි.

The Important of Being Earnest දරුණු මෙන්ම එංගලන්ත සභාවේ නියමයන් පිළිපදින්නෙකුගේ ස්වරූපයද දරයි. මෙය ඔහුගේ Lady Windermere's නම් නාට්‍යය සඳහාද අදාලය. මෙම නාට්‍ය තුළ Earnest හි සෙවනැල්ල වැටී ඇති බවක් පෙනී යන අතර එය බොහෝ සාහිත්‍ය කාර්යයන්හිදී සිදුවන්නකි.

සැහැල්ලු සමාජ නාටකයක් අඳුරු සිද්ධීන් හැසිරවීමට යොදා ගැනීමේදී උපයෝගී කරගනු ලබන ශබ්ද ලීලාවේ අස්ථාවර භාවයක් ඉඳහිට දක්නට ලැබීමෙන් එය සළකුණු කෙරේ. එක් තලයකදී එහි බලපෑම තියුණු විප්ලවකාරී ස්වරූපයක් දරයි. සම්මත

සමාජයේදී සුචරිතවාදී වින්ඩ්මියර් මහත්මිය ආචාර ධර්මයන් කෙරෙහි අත්තනෝමතික ලෙස රැඳී නොසිට, පිටතින් පැමිණෙන උපේක්ෂා සහගත සුචරිතවාදී අර්ලින් මහත්මියට සිය අභිමතය පරිදි ධෛර්යවන්තව හා කාරුණිකව සිටීමට ඇති හැකියාව පිළිගත හැකිව තිබුණි. එසේම කාන්තාවකට මවක නොවී ප්‍රබලව දරු සෙනෙහස ඇති කර ගැනීමට හැකියාව ඇති බවද පිළිගත යුතුය. වයිල්ඩ් නිතර කරන පරිදි දෘඪ අන්ත දෙකක් වන හොඳ සහ නරක බිඳ සමයි. මෙහිදී අහම්බෙන් මෙන් සිදුවී ඇත්තේ සම්මතවාදී සමාජය ඔසවා තැබෙන අයුරිනි. අර්ලින් මහත්මියගේ ස්වකීයත්වය කැප කෙරෙන නිශ්ශබ්දතාව සහ පිටවයාම සම්මත රටාව සුරැකීමක් වන අතර, “තමාගේ උත්පත්තිය ගරු කටයුතුය” යන මායාවේ රැඳී සිටීමට වින්ඩර්මියර් මහත්මියට ධෛර්යය සැපයීමකි. Earnest හි අවසානය සමාජයට පිළිගත හැකිවීම නිසා සත්‍යයට පිටවීමට අවකාශ ලැබුණු නමුත් මෙම නාටකයේදී සමාජ ජීවිතයේ කල්පිතයන්ට පැවතීමට ඉඩ සැළසෙන පරිදි දූෂිත උත්පත්තින් පිළිබඳ සත්‍යය යටපත් විය යුතුව ඇත. සමාජ රටාවන් බිඳ නොවැටීමට නම් වයිල්ඩ් සේම, බර්ලින් මහත්මියද පිටස්තරයෙකු වශයෙන් බිල්ලට දිය යුතු විය. නාට්‍යය විප්ලවකාරී ස්වරූපයක් ඉසිලුවේ නම් මෙම පීඩිතයා වෙනුවෙන් කරුණාව දැක්විය යුතුව තිබුනද, සභාවේ නියමයන් නිහඬව පිළිගනිමින් ඇය දර්ශනයෙන් ඉවත් කෙරිණි. අවසානයේ ඇයට ගරු කටයුතු සැමියෙකු හිමිකර දීමෙන් ඇයට සිදුකරන ලද වරද වෙනුවෙන් සහනයක් ලබාදීමට වයිල්ඩ් උත්සාහ දරා ඇත.

A Woman of No Importance හි, තම පියා පිළිබඳව නොහඳුනන පුත්‍රයෙක්ද, පුතා පිළිබඳව නොදන්නා පියෙක්ද සිටිති. මෙම නොහැඳිනීම නිසා හටගන්නා අර්බුදය විසඳෙනුයේ මවගේ මැදිහත්වීමෙන් ඥාතීත්වය හෙළිදරව් කිරීමෙනි. පියා කළ වරද නිසා ඔහු Man of No Importance - වැදගැම්මකට නැති මිනිසෙකු බවට පත්වේ. ඉහළ සමාජයේ පුද්ගලයින්ගේ නොමනා හැසිරීම් දෙස සෝප්හාසයෙන් හෙළන ලද බැල්මක් මේ නාට්‍යයේ ගැබ්ව ඇත.

An Ideal Husband ලන්ඩනයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ යටිකුට්ටු ක්‍රියාදාමයක් අළලා ලියැවුනු නාටකයකි. මෙහි ප්‍රධාන භූමිකාව වනුයේ වයිල්ඩ්ගේ සිත්ගත් ගෝරිං සාමිවරයාය. ඔහු චෙව්ලි මහත්මියගේ කුමන්ත්‍රණකාරී ක්‍රියාවන් අනාවරණය කර ගනී.

ලිපියක් පෙන්වා බිය ගැන්වීම මගින් ඉටුකර ගැනීමට උත්සාහ දරණ අයුතු ප්‍රයෝජනය ගෝරිං සාමිවරයා විසින් හෙළිදරව් කෙරෙයි.

ඔහු විසින් 1892 ට ආසන්න කාලපරිච්ඡේදයකදී ප්‍රංශ බසින් රචිත සැලෝමේ, අලංකාර වර්ණනයන්ගෙන් යුත් සාහිත්‍යාත්මක නාට්‍ය කෘතියකි. පරණ තෙස්තමේන්තුවේ එන බැබිලෝනයේ හෙරෝද් ඇන්ටිපස් ගේ සමයේ සිදුවූ ශාන්තුවර ජෝන් බැප්ටිස් ඝාතනය සම්බන්ධ පුවත නාට්‍යාකාරයෙන් ඉදිරිපත් කිරීම මෙයින් සිදු කෙරේ. යේසුස් වහන්සේගේ පැමිණීම පිළිබඳව ඉඟිකෙරෙන අනාගත වාක්‍ය ප්‍රකාශවීම මෙම නාට්‍යයේ දිගින් දිගටම සිදුකෙරේ. එහෙත් උන්වහන්සේගේ පැමිණීම ප්‍රකාශ කරනු ලබන අනාගත වක්තෘ ජොකනාන් හිස ගසා දැමීමෙන් මරණයට පත්කරනු ලබයි.

වයිල්ඩ් හට සැලෝමේ පුවත නාට්‍යයක් බවට පත්කිරීම සඳහා ආනුභාවය පෑ කෘතීන් කිහිපයක් 19 වෙනි සියවසේදී එළිදක්නා ලදී. 1877 දී Trois Contes හි පලවූ ගුස්ටාෆ් ෆ්ලෝබෙයාර්ගේ "හෙරෝදියස්" කෙටිකතාව ඉන් එකකි. ගුස්ටාෆ් මොරෙයු විසින් අඳින ලද "හෙරෝද් ඉදිරියේ නටන සැලෝමේ" නම් වූ චිත්‍රයද වයිල්ඩ් හට උත්තේජනය සැපයූ කෘතියකි. එකී චිත්‍රය පිළිබඳ විසිතුරු විස්තරයක් A Rebours (1884) නමින් යුත් සිය නවකතාවට ජොරිස් කාල් හියුස්මන් විසින් ඇතුලත් කරන ලදී. බෙහෙවින් සරාගී වර්ණනයක් වූ එය වයිල්ඩ්ගේ සිත් ගත්තාට සැක නැත. හේන්රිච්හේන් තම Atta Troll වීර කාව්‍යයේ හෙරෝදියස් ජෝන්ගේ කපන ලද හිස සරාගී උන්මාදයෙන් සිපගත් බව සඳහන් කර ඇත. ජෝන් බැප්ටිස්ගේ හිස කැපීම ගැහැණියකගේ වුවමනාවට සිදුවූ බව මෙමගින් අනාවරණය කරයි. සැලෝමේ විසින් ජොකනාන්ගේ හිස ඉල්ලීම හා පසුව සිපගැනීම හෙරෝදියස්ගේ මෙම ක්‍රියාව සැලෝමේට ආදේශ කිරීමකි. ජේ.සී. හේවුඩ් 1962 ලියන ලද නාට්‍යමය කාව්‍යයේ සැලෝමේ සම්බන්ධ කතා පුවත සඳහන්ය.

ඉහත කී විවිධ කලා කෘතීන්වලින් එළිදැක්වූ කතා පුවත නාට්‍යමය අත්දැකීම් බවට පත්කිරීමට වයිල්ඩ්ට හැකිවිය. ප්‍රංශයේදී සංකේතවාදීන් (Symbolists) සමග කිට්ටු ඇසුරක් පැවැත්වූ වයිල්ඩ් හට සැලෝමේ රචනා කිරීමේදී ඔවුන්ගේ ආභාෂයද ලැබී ඇත.

මෙම නාට්‍යය එක් අතකින් ඔහුගේ සමාජ ප්‍රහසන නාට්‍යවලට හාත්පසින්ම වෙනස් ස්වරූපයක් ගනී. එපමණක් නොව වර්ණනයේදී විදේශ භාෂාවකින් එය කිරීම සඳහා ඔහු තුළ පැවති නිපුණතාවද පසක් කරයි.

මෙහිදී කාන්තාවන් තුළ පවත්නා බලසම්පන්නභාවය මනාසේ විදහා දැක්වීමට සැලෝමේගේ චරිතය ඔහු උපයෝගී කරගනී. සිය මව වන සක්‍රිය ස්ත්‍රියක වූ "ස්පෙරන්සා" ගේ ස්වීරසාර භාවයද ඔහු සිය මතකයට නගා ගන්නට ඇති බවට සැක නැත. සැලෝමේගේ රූ සපුවට වසඟවන තරුණ සිරියානුවාගේ ඛේදවාචකයද, එසේම වසඟවන හෙරෝද් ට අත්වන පසුබෑමද පිළිබඳව සළකන කල ස්ත්‍රියකගේ ක්‍රියාකාරීත්වයේ භයානකකම හුවා දැක්වීමේ අදහසක් වයිල්ඩ් තුල විද යන්න කෙනෙකුට අනුමාන කළ හැක.

වයිල්ඩ් පිළිබඳව කතා කරන කල කිසි විටෙකත් අමතක කළ නොහැකි සමලිංගිකත්වය මෙම නාට්‍යයටද ප්‍රවේශ වී ඇති බව පෙනී යයි. හෙරෝදියස්ගේ ළමා සේවකයා එක් අතකින් සිරියානු කපිතාන්වරයා සැලෝමේ දෙස බැලීම වැලැක්වීමට තැත් දරයි. ඔහු මිය ගිය පසු ඔහු තමාගේ සමීප මිතුරෙකුව සිටි සැටිත්, ඔහුට තෑගි දුන් සැටිත්, ඔහු සමග සවස්කල ගං ඉවුරේ ඇවිදිමින් සිටි සැටිත්, ගඟේ බැස නාද්දී ඔහු තමාගේම සිරුර දෙස බලා සතුටුවීමට උනන්දු වූ සැටිත් ප්‍රකාශ කරන ආකාරයෙන් ඔහු හා පැවති මිත්‍රත්වයේ සමීපතාව ප්‍රකට කෙරේ. තවද හෙරෝද් මියගිය සිරියානුවා මාළිගයේම තබාගත් අයුරුද, ඔහු දැකීමට ප්‍රියමනාප කඩවසම් අයෙකු බවට කරන ප්‍රකාශනයෙන්ද, මෙම සමලිංගිකතාව ඉඟි කෙරේ. ඉඩ ලද සෑම අවස්ථාවකම වයිල්ඩ් සිය ප්‍රියමනාප ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වූ බවට මෙය සාක්ෂියකි.

සැලෝමේ නාටකය නරඹන්නෙකුට රෝම නාට්‍ය නාට්‍යකරු සෙනකාගේ නාට්‍යයන්හි එන කෲරතර දර්ශනයන් සිහි ගැන්වෙනවාට සැක නැත. "මීඩියා" වැනි නාටකයක සිය දරුවන් මරා විසි කරන දර්ශන අන්තර්ගත වූවා සේම ජොකනාන්ගේ හිස බොහෝ වේලා රිදී පළඟානක් මත ප්‍රදර්ශනය කිරීම බියකරු අත්දැකීමක් වෙයි. සිය මව වසඟයට ගත් සුළු පියා වන හෙරෝද් තමාට දක්වන ලැදියාව නුරුස්නා බැවින් දැඩි පළිගැනීමේ ආශාවකට ලක්වූ සැලෝමේ මීඩියාගේ චරිතයට එක් අතකින් සමීප වෙයි.